# 11

# හජ් පිළිවෙත හා එහි වැදගත්කම



**නුඹලා හජ් සහ උම්රාහ් (අල්ලාහ් ප්‍රසාදයට පත් කිරීමට) ඉටු කරනු.** (2:196)

**හජ් යනු මක්කාවේ සිද්ධ ස්ථානවලට ගොස් නියමිත ක්‍රියාවන් නියමිත කාලයේ ඉටු කිරීම ය.**

මෙය හිජ්රි 9වන වසරේ අනිවාර්ය කරන ලද බව බහුතරයකගේ අදහස වේ. මුස්ලිම් වූ, ස්වාධීන වූ, සිහිබුද්ධිය ඇති, නිසි වයසට පත් වූ, පහසුකම් හා හැකියාව ඇති අයට තම ජීවිතයේ එක් වරක් හෝ හජ් කිරීම අනිවාර්ය වගකීමකි.

නබි ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමාගේ පවුලේ සාමාජිකයෝ, 'අල්ලාහ්ගේ අණ මුළුමනින් ම ඉටු කළ යුතු ය' යන හැඟීමෙන් විවිධ පරිත්‍යාග කළහ; තම ප්‍රාණය, ඥාතීත්වය පවා අහිමි කර ගැනීමට ඉදිරිපත් වූහ. මෙම සිදුවීම්වල සිහිවටනයක් ලෙස හජ් නිරූපණය වේ.

නබිවරු අල්ලාහු තආලාගේ විවිධාකාර වූ පරීක්ෂණයන්ට ලක්වූවෝ වෙති. මොවුන් අතරින් දැඩි පරීක්ෂණයකට ලක් වූයේ ඉබ්රාහීම් අලෛහිස්සලාම් තුමා ය. මෙම සියලු ආකාරයේ පරීක්ෂණවලින් එතුමා ජය ලැබුවේ ය. එතුමාගේ ද, එතුමාගේ පවුලේ අයගේ ද පරිත්‍යාගශීලී ඉතිහාසය සිහිගන්වන එක් වගකීමක් ලෙස හජ් පිළිවෙත දක්නට ලැබේ. එම නිසා හජ් හි නීති රීති කෙටියෙන් විමසා බලමු.

## හජ්ජි අර්කාන් (ෆර්ලු)

- නියියත් තැබීම (ඉහ්රාම් ඇඳීම)
- දුල්හජ් 9 වන දින අරෆාවෙහි රැඳීම
- තවාෆුල් ඉෆාලා ඉටු කිරීම
- සඊ කිරීම
- හිස කෙස් ඉවත් කිරීම
- ඉහත පිළිවෙත් අනුපිළිවෙළින් ඉටු කිරීම



## හජ්ජි වාජිබ්

1. නියමිත මීකාතයේ නියියත් තැබීම (ලාංකික හාජිවරු යලම්ලම් යන ස්ථානයේ නියියත් තබති)
2. දුල්හජ් දහ වන දින රාත්‍රියේ මුස්දලිෆාවේ රැඳීම
3. අයියාමුත් තෂ්රීක් යන (දුල්හජ් 11, 12, 13) දිනවල මිනාහි රැඳීම
4. දුල්හජ් දහ වන දින ජම්රතුල් අකබාහි ගල් 7ක් විසි කිරීම
5. අයියාමුත් තෂ්රීක් දිනවල මධ්‍යාහ්නයෙන් පසු ජම්රතුල් අකබා, ජම්රතුල් වුස්තා ජම්රතුල් ඌලා යන ජම්රා තුනෙහි ගල් හත බැගින් විසි කිරීම
6. තවාෆුල් විදා ඉටු කිරීම

## හජ්ජි සුන්නත්

1. නියියත් තැබීමට පෙර ද, මක්කාවට ඇතුළු වීමට පෙර ද, අරෆාලිෆා වැනි ස්ථානවල රැඳීමට පෙර ද, ජම්රාවල ගල් විසි කිරීමට පෙර ද, තවාෆ් කිරීමට පෙර ද, ස්නානය කිරීම
2. නියියත් තැබීමට පෙර සිරුරේ සුවඳ විලවුන් තවරා ගැනීම
3. නියියතය මුවින් ප්‍රකාශ කිරීම
4. තල්බියා පාරායනය කිරීම
5. මක්කාවට ඇතුළු වූ විගස තවාෆ් කිරීම (තවාෆුල් කුදූම්)

6. දුල්හජ් නව වන දින රාත්‍රියේ මිනාහි රැඳීම

7. නියමිත ස්ථානවල අදාල දුආ පාරායනය කිරීම

8. (Z)සම් (Z)සම් ජලය අධික ව පානය කිරීම

## ඉහ්රාම් පැළඳීමෙන් පසුව වැළකී සිටිය යුතු කරුණු

1. හිසකෙස් සම්පූර්ණයෙන් ඉවත් කිරීම හෝ කැපීම
2. නියපොතු කැපීම
3. පුරුෂයන් තම හිසකෙස් ආවරණය කිරීම
4. පුරුෂයන් මසන ලද ඇඳුම් ඇඳීම
5. සුවඳ විලවුන් තැවරීම
6. ගොඩබිම ජීවත් වන සතුන් දඩයම් කිරීම
7. ශාරීරික සම්බන්ධතා පැවැත්වීම
8. විවාහ වීම

## හජ් වගකීම තුන් ආකාරයකට ඉටු කළ හැකි ය.

**1. අල් ඉෆ්රාද්** : මෙය හජ් පමණක් ඉටු කරන ක්‍රමයකි.

**2. අත්තමත්තුඋ** : මෙය උම්රා ඉටු කර ඉහ්රාම් ඇඳුම ඉවත් කළ පසු, නැවත හජ් සඳහා පමණක් නියියත් තබා ඉහ්රාම් ඇඳ (දෙක ම එකතු කර) කරන ක්‍රමයකි.

**3. අල් කිරාන්** : මෙය හජ් හා උම්රා එකට එකතු කර එක ම ඉහ්රාමයෙන් කරන ක්‍රමයකි.

මෙම ආකාර තුනෙන් ඕනෑ ම ක්‍රමයක් අනුගමනය කරමින් කෙනෙකුට හජ් ඉටු කළ හැකි ය.

## හජ් ඉටු කරන ආකාරය

දුල්හජ් අට වන දින හජ් ආරම්භ වේ. එදින හාජිවරු ස්නානය කර, පිරිසිදු වී, සුවඳ විලවුන් තවරා, නියියතයත් සමග ඉහ්රාම් ඇඳ, නතර වී සිටින ස්ථානයේ සිට තල්බියා පවසමින් මිනාවට පැමිණෙති. එහි දී ඔවුහු ලුහර්, අසර්, මඃරිබ්, ඉෂා හා සුබ්හු සලාත් ඉටු කරති. රකඅත් හතරක් වන සලාත් රක්අත් දෙකක් ලෙස කෙටි කර ඉටු කිරීම සුන්නත් වේ. එහි සිට නව වන දින හිරු උදා වූ පසු අරෆාවට යති; එහි ලුහර් සමග අසර් එකතු කර ද කෙටි කර ද ඉටු කරති; බොහෝ වේලාවක් දීර්ඝ ලෙස දුආ පාරායනය කරමින් කාලය ගත කරති. හිරු බැසගිය පසු එහි සිට මුස්දලිෆාව කරා ගමන් කරති. එහි මඃරිබ් හා ඉෂා සලාත් එකතු කර ඉටු කරති; ඉෂා කෙටි කර ඉටු කරති; එදින රාත්‍රිය මුස්දලිෆාවේ ගත කරති.


දහවන දින මුස්දලිෆාවේ සුබ්හු සලාතය ඉටු කර මිනාව බලා පිටත් වෙති. (ජම්රාත්වල ගල් ගැසීමට ගල් ද එකතු කර ගනිති.) මිනාවෙන් පිටත් වී (ලුහර්වලට පෙර) ජම්රතුල් අකබාහි ගල් හතක් ගසති. පසුව හිසකෙස් (කාන්තාවන් හිස කෙස්වලින් කුඩා ප්‍රමාණයක්) කැපිය යුතු ය. එදින දසවන චන්ද්‍ර දිනය වන ඊද් උත්සව දිනය වන බැවින් ඉහ්රාම් ඇඳුම ඉවත් කර සාමාන්‍ය ඇඳුමක් ඇඳ ගනිති. ඉන්පසු මක්කාවට ගොස් තවාෆුල් ඉෆාලා ඉටු කරති. මෙය ප්‍රමාද කර ද ඉටු කළ හැකි ය.

දුල්හජ් 11, 12, 13 යන දිනවල ලුහර්වලට පසු මිනාහි රැඳී සිට ජම්රා තුනෙහි ම ගල් ගසති. පෙර කී පරිදි තවාෆුල් ඉෆාලා ඉටු නොකළ අය කෑබතුල්ලාහ්වට ගොස් එය ඉටු කරති. තවාෆ්වලට පසු සඊ ඉටු කළ යුතු ය. අවසාන වශයෙන් මක්කාවේ සිට තම මව්බිමට හෝ මදීනාවට හෝ පිටත් වීමට පෙර තවාෆුල් විදා ඉටු කළ යුතු ය.

## ප්‍රයෝජන

**හජ් කිරීමට හැකියාව තිබිය දී එය ඉටු නොකළ අය යහූදිවරයකු ලෙස හෝ නසාරාවරයකු ලෙස මරුමුවට පත් වෙති. (තිර්මිදි)** යැයි නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් පවසා ඇත. **"නිසි ආකාරයට හජ් ඉටු කළ තැනැත්තා එදින උපන් ළදරුවකුගේ තත්ත්වයට පත් වේ." (බුහාරි)** යනුවෙන් ද නබි සල්ලල්ලාහු අලෛහි වසල්ලම් තුමන් පවසා ඇත. හජ් කිරීම සඳහා නිවසින් පිටව ගිය කෙනෙකු හජ් ඉටු කිරීමට පෙර අතර මඟ දී මිය ගිය ද ඔහුට හජ් ඉටු කළ කුසල හිමි වේ.

එපමණක් නොව, හජ් මගින් ගැත්තෙක් තම සම්පූර්ණ යටහත්භාවය අල්ලාහ් වෙත පෙන්නුම් කරයි. ඔහු ඒ වෙනුවෙන් තම කාලය, සම්පත්, සිරුර, සිත ආදී සියල්ල යොමු කරයි; පුණ්‍ය කටයුත්තක් වෙනුවෙන් තම කාලය වැය කරයි; දේව සිතුවිල්ලෙන් සතුටක් ලබයි; තක්වාව වර්ධනය කර ගනියි; සහෝදර මුස්ලිම්වරුන් සමඟ එක්ව සිට හජ් ඉටු කිරීමෙන් සමානාත්මතාව, සහෝදරත්වය, එකමුතුකම, කැප කිරීම, ඉවසීම, සහජීවනය, පරලොව මෙනෙහි කිරීම යනාදිය හජ් මගින් පුහුණු කරනු ලබයි.



### අභ්‍යාස

1. හජ්හි ෆර්ලු හා වාජිබ් වෙන - වෙන ම සඳහන් කරන්න.

2. හජ් මගින් ඇති වන සමාජීය ප්‍රයෝජන හතරක් ලියන්න.

3. හජ් වගකීම ඉටු කළ හැකි ආකාර තුන සඳහන් කරන්න.

4. හජ් වගකීම අනිවාර්ය වූයේ හිජ්රි කී වන වසරේ දී ද?

### ක්‍රියාකාරකම්

හජ් වගකීම ඉටුකළ කෙනෙකු මුණ ගැසී, ඔහුගේ අත්දැකීම් විමසා ලියන්න.